# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2147/58 - 2019 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2019.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2007

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත**

18 වන වගන්තිය යටතේ වූ නියමය

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය අජිත්. පී. පෙරේරා වන මා විසින්, මේ නියමය මගින්, එකී පනතේ කාර්යය සඳහා සහතික කිරීමේ බලාධිකාරය වශයෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම (ශ්‍රී ලංකා සර්ට්) මෙයින් නම් කරනු ලැබේ.

2013 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 1829/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 18 වන වගන්තිය යටතේ සාදන ලද නියමය ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් අවලංගු කරනු ලැබේ

**අජිත් පී. පෙරේරා,**
ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ
අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 28 වැනි දින.
කොළඹ දී ය.

11 - 1074